ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 නිලධර ගණයේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි පුහුණු ශ්‍රේණිය සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය - 2026

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 27ක් සම්පූර්ණ කිරීමට පුහුණු ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීම තරග විභාගයක ප්‍රතිඵල මත සිදු කරන අතර එම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2027 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ඇත.**

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services " යටතේ ඇති "Online Applications-Recruitment / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 නොවැම්බර් මස 16 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් මස 11 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.**

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

1. **තනතුරට පැවරෙන කාර්යයන් :**

මුහුදේදී ධීවර කාර්මිකයන්ට සහ ධීවර යාත්‍රාවලට වන ආපදා සම්බන්ධව කටයුතු කිරීම, දිනපතා ධීවර කාර්මිකයන්ට අදාළ කාලගුණ වාර්තා සැපයීම, ධීවර ප්‍රාදේශීය කාර්යාලවල පණිවුඩ හුවමාරු සඳහා සම්බන්ධ වීම, ධීවර යාත්‍රා සමග පණිවුඩ හුවමාරුව, ඔවුන්ගේ යාත්‍රා හිමියන්ට සහ අවශ්‍ය අයට තොරතුරු ලබා දීම, නවීන තාක්ෂණය මගින් විධිමත්ව ධීවර කාර්මිකයන්ට තොරතුරු ලබාදීමට සලසා ඇති ක්‍රමවේද පවත්වාගෙන යාම හා පැය 24 පුරාම ධීවර කාර්මිකයන්ට තොරතුරු ලබා දීම යන රාජකාරිවලින් සමන්විත තනතුරකි. (රාත්‍රී වැඩ මුර අනිවාර්ය වේ.)

2. **සේවා කොන්දේසි :**

(අ) රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.08.14 දින අංක PSC/EST/7/1/36/1/2012 දිනැතිව අනුමත කර ඇති කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 සේවා ගණයෙහි කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට ද එම පටිපාටියට දැනට කර ඇති හෝ මතුවට කරනු ලබන්නා වූ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු පුහුණු කාලසීමාව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද අනාගතයේදී බඳවා ගනු ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) මෙම පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සාගර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන මාස හයක (06) පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබාගත් පසුව කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියට තෝරා පත්කරනු ලැබේ.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

(ඉ) පුහුණු කාල සීමාවට බඳවා ගෙන III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් III ශ්‍රේණියට පත්වීම් ලද දින සිට වසර 10ක කාලයක් අනිවාර්යයෙන්ම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට සේවය කළ යුතු ය.

(ඊ) එසේ වසර 10 ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත්, ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් වගකීමකට බැඳිය යුතු ය.

(ඒ) පුහුණුව අවසානයේ දී ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර, සමත් වන පුහුණු ශ්‍රේණියට අයත් නිලධාරීන් III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වන්නන් හට නැවත පැවැත්වෙන පුහුණුව අවසන් පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවස්ථා 02 ක් ලබාදෙන අතර, ඉන් ද, අසමත් වන අයගේ පුහුණු පත්වීම අවසන් කරනු ලැබේ.

3. **වැටුප් කාණ්ඩය සහ පරිමාණය :**

කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුව කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි පුහුණු ශ්‍රේණියේ පුහුණු කාලයට අදාළ මාසික දීමනාව රු. 12,000/- ක් වේ.

සාගර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන මාස හයක (06) පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබාගත් ආධුනිකයන් කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ. ඊට අදාළ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපලේඛන II (MT 1-2025) අනුව රු. 50,090 – 10 X 540 – 11 X 630 – 10 X 1,010 – 10 X 1,190 – රු. 84,420/- (ආරම්භක වැටුප් පියවර - 50,090/-) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

4. **අධ්‍යාපන සුදුසුකම් :**

I. **සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම**;

හා

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. පැරණි විෂය නිර්දේශය විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

5. **වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.**

6. **පළපුරුද්ද : අදාළ නොවේ.**

7. **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක (ශ්‍රී ලංකා භූමියට අයත් දූපත් ද ඇතුළු) සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

8. **වෙනත් සුදුසුකම් :**

I. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් වන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

9. **වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වනවිට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2008.12.11 දින හෝ ඊට පෙර හා 1991.12.11 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

10. **බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී පුහුණු ශ්‍රේණිය සඳහා බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාවක් නොලැබෙන අතර එම ආධුනිකයන්ගේ පුහුණුව අවසන් කරනු ලැබේ.

11. **ලිඛිත විභාගය:**

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
1. බුද්ධි පරීක්ෂණය	*පැය 01*	*100*	*40*
2. සාමාන්‍ය දැනුම	*පැය 01*	*100*	*40*

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වන අතර සියලුම ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

12. විභාගය සඳහා විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රය	*විෂය නිර්දේශ*
බුද්ධි පරීක්ෂණය	සංඛ්‍යානමය හැකියාව, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 01 යි.)
සාමාන්‍ය දැනුම	ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය, ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හී වැදගත් සිද්ධීන් ද අදාළව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබන බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. (කාලය පැය 01 යි.)

13. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ වේ.

14. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

සටහන :-

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

15. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

16. විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම :

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියමකර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

(*ඇ*) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(*ඈ*) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

17. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

18. පත් කිරීම සඳහා තෝරා ගැනීම :

ලිඛිත පරීක්ෂණයේ ඉහළ ලකුණු ලබන අයදුම්කරුවන් අතරින් බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන සංඛ්‍යාවක් පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පුහුණුව සාර්ථකව නිම කර සහතික පත්‍ර ලබා ඇති අයදුම්කරුවන් කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි III තනතුර සඳහා තෝරා පත් කරනු ලැබේ. ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත සලකා බලනු නොලැබේ.

19. ප්‍රතිඵල නිකුත් කිරීම :

අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත. "විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ."

20. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක්, ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ.

21. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

22. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැළපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යයෙන් පළකරන ලද දැන්වීම බලාත්මක වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,

2026 නොවැම්බර් මස වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

11 - 152